# අන්තර්ජාතික ප්‍රාචීන භාෂා පර්යේෂණ සමුළුව

# INTERNATIONAL CONFERENCE ON ORIENTAL LANGUAGES (ICOL-2019)

# සාර සංක්ෂේප සඞ්ග්‍රහය

# PROCEEDINGS

145 YEARS OF EXCELLENCE

60

ANNIVERSARY

1873 - 1959 - 2019

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

UNIVERSITY OF SRI JAYEWARDENEPURA

# මහනුවර යුගයේ, මාතලේ දිසාවේ, හමුදාවේ ලේකම්මිටියෙන් හෙළිවන විශේෂ භාෂා ව්‍යවහාර

චන්ද්‍රාණි ලංකාමුල්ල[1] කුසුමලතා ලංකාමුල්ල[2]

## හැඳින්වීම

ක්‍රි. ව. 1592 සිට 1815 දක්වා වූ සියවස් කිහිපයක කාල සීමාව සිංහල සාහිත්‍යයෙහි මහනුවර සමය ලෙස සැලකෙයි (සන්නස්ගල, කොළඹ: 1961). ලාංකේය රාජ්‍ය පාලනය පිළිබඳ තොරතුරු ලේඛනගත කිරීම අනුරාධපුර යුගයේ පටන් සිදු වූ බව වංශකථාවලින් හා සෙල්ලිපි අධ්‍යයනවලින් පැහැදිලි වේ. මෙකල රාජ්‍යය පාලනය වූයේ **රාජකාරී ක්‍රමය** මතය. රජයේ ප්‍රධානතම ආදායම් මාර්ගය **රාජකාරිය** සහ ඊට අදාළ සේවාවලින් ලද ආදා- යමයි. රාජ්‍ය පාලනයට අවශ්‍ය සම්පත් එක්තැන් කිරීම, රජයේ ආදායම රැස් කොට මහ ගබඩාවේ තැන්පත් කිරීම, සිවිල් හා යුද පාලන කටයුතු නියාමනය කිරීම වැනි තොරතුරු නිසි පරිදි ලේඛනගත කොට නිවැරදිව, ක්‍රමානුකූලව ලියා තැබීමේ ක්‍රමවේදය වඩාත් තහවුරු වූයේ මහනුවර යුගයේදීය. පරිපාලනමය කඩඉම් (අභයවර්ධන, 1978: කොළඹ), සන්නස් හා තුඩපත් (තිස්සකුමාර, : 1992 කොළඹ ), අත්තානි ප්‍රදාන (තිස්සකුමාර, කොළඹ, 1990), දිවි සිට්ටු ආදි විවිධ විෂයවලට (Coomaraswami, New York: 1955) අයත් ලේඛන රාශියක් මෙකල බිහිවන අතර එයින් රාජ්‍ය

1 ලේඛන විමර්ශන නිලධාරී, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, chandilanka63@gmail.com

2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, kusumalathalanka@gmail.com, klanka-mulla@sjp.ac.lk

තොරතුරු රැස්කර තබන ලද ලේඛනවලින් ඒකදේශයක් ලේකම් මිටි (අභයවර්ධන, 2002: කොළඹ) නමින් හැඳින්වෙයි. මෙකී ලේඛන චූල ගණයේ ඓතිහාසික ලේඛන වශයෙන් හඳුන්වයි. ලේකම් මිටි ප්‍රවර්ග කිහිපයකි. කත්හාල් ලේකම්මිටිය, දිසාවේ මහලේකම් පොත, හී ලේකම්මිටිය, කාර්යාංශ ලේකම්මිටි ආදි වශයෙනි. සිවිල් හා රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් සකස් කරන ලද ලේකම්මිටි යටතට දුනුකාර ලේකම්මිටිය, මඩුවේ ලේකම්මිටිය, වඩන තුවක්කු, ලේකම්මිටිය සහ හමුදාවේ ලේකම්මිටිය අයත් වෙයි. (අභයවර්ධන, 2002: 75). හමුදාවේ ලේකම්මිටිය කොටස් කිහිපයකින් යුක්තය. එය ඉඩම් පැවරීම, ඉඩම්වල ප්‍රමාණය, අස්වැන්න අයවන ආකාරය, දැකුම් රාජකාරිය, විශේෂයෙන් හමුදාවට සපයන ලද ආයුධ බෙදී ගිය ආකාරය ආදි වශයෙනි. මෙම ලේඛන හැරුණු විට විහාර දේවාලයගම්වලට අයත් ඉඩකඩම් පිළිබඳ විස්තර දැක්වෙන පෞද්ගලික ස්වරූපයේ ලේකම්මිටිද විය. උදා දළදා මාළිගාවේ ලේකම්මිටිය, නින්දගම් අයිතිකරුවන්ගේ වලව්ව ලේකම්මිටි ඊට නිදසුනි.

සිංහල භාෂාවේ විශේෂතා සම්බන්ධයෙන් මෙන්ම සමාජීය, ආර්ථික, වශයෙන්ද මහනුවර සමය සංක්‍රාන්තික අවධියකි. පෘතුගීසි, ඕලන්ද ජාතීන්ගේ බලපෑම අවසන් වූ කල ඉංග්‍රීසි ජාතීන්ගේ ආගමනය සිදු වන අතර රාජකාරි ක්‍රමයෙහි අවසන් කාලපරිච්ඡේදය ගෙවා දමමින් සිටින අවස්ථාව මෙයයි. රාජකාරී ක්‍රමය හා සම්බන්ධ දත්ත සොයාගත හැකි වාර්තාවලින් ඉතා වැදගත් කොටසක් මෙයින් ආවරණය වෙයි (පීරිස්, කොළඹ: 2005). මෙම ලේකම් මිටි සමකාලීන භාෂා ලක්ෂණ අධ්‍යයනයේදීද මාහැඟි මූලාශ්‍රයක් වෙයි. තත්කාලීන ගද්‍ය සාහිත්‍යයෙහි විද්‍යමාන භාෂා ලක්ෂණවලට වඩා ලේකම් මිටියෙහි විශේෂත්වය වනුයේ කාර්යාංශ, හමුදා නිලනාම, එම නිලවලට අදාළ ඉඩම් භුක්තිය කෙසේද ආදි සමාජීය තොරතුරු රාශියක්ද ඉන් හෙළිවීමයි. ඒ අතර දින, වකවානු පිළිබඳ විශේෂ භාෂාත්මක යෙදුම්, පුද්ගල නාම, ඉඩම් පරිහරණය පිළිබඳ විශේෂ භාෂා ව්‍යවහාර වැනි කරුණු හෙළි කරගත හැකි මූලාශ්‍රයක් වශයෙන්ද මෙය වැදගත් වන අතර තත්කාලීන භාෂා භාවිතයෙහි වාග් විද්‍යාත්මක තොරතුරු හෙළිකර ගත හැකි මාහැඟි මූලාශ්‍රයක්ද වෙයි.

### පර්යේෂණ ගැටලුව

මාතලේ හමුදාවේ ලේකම් මිටිය සමකාලීන භාෂා ලක්ෂණ හෙළි කරගත හැකි මූලාශ්‍රයක් ලෙස සැලකිය හැකි ද යන පර්යේෂණ ගැටලුවට පිළිතුරු සොයා යමින් මෙම අධ්‍යයනය සිදුකෙරේ.

### පර්යේෂණ අරමුණ

මාතලේ දිසාවේ හමුදාවේ ලේකම් මිටිය පාදක කොට ගෙන තදීය සමයෙහි විශේෂ භාෂා ව්‍යවහාර අධ්‍යයනය කිරීම

### ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමට උපයෝගී කොට ගනු ලබන ප්‍රධාන ප්‍රාථමික මූලාශ්‍රය මාතලේ දිසාවේ හමුදාවේ ලේකම්මිටියයි. එය බත්තරමුල්ල, ඉඩම් අමාත්‍යාංශයෙහි, **ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ලේඛනාගාරයේ පුස්කොළ පොත් එකතුවට අයත් වූවකි. එහි පත් ඉරු 192 කි.** පුස්තකාල අධ්‍යයන යටතේ නිසි පරිදි ප්‍රාමාණික ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කෙරෙයි. ඒ යටතේ මෙකී හමුදා ලේකම් මිටියෙන් කොටසක්ද ඇතුළුව සංස්කරණය කරන ලද **ලේකම්මිටි විමර්ශනය (අභයවර්ධන, 2002, පැරණි ලක්දිව අත්තානි ප්‍රදාන විධි (තිස්සකුමාරඃ 1990), සන්නස් සහ තුඩපත්** (තිස්ස කුමාරඃ 1992), සිංහල ආණ්ඩුව (විමලකිත්ති හිමි, 1955) ආදි ප්‍රාමාණික ද්විතියික මූලශ්‍රයද පරිශීලනය කිරීමට නියමිත ය. එසේම ශබ්දයෝගය, පදක යෝගය, වාක්‍ය වින්‍යාසය යනාදි න්‍යායාත්මක ප්‍රවේශ ඔස්-සේ මෙහි භාෂා ව්‍යවහාර විග්‍රහ කරමින් තාර්කික නිගමනවලට එළඹීමට අපේක්ෂිතය.

### සාකච්ඡාව හා ප්‍රතිඵල

ඉංග්‍රීසි භාෂාව මාධ්‍ය භාෂාව බවට පත් වීමට ආසන්න සමයක මෙම ලේකම් මිටිය ලියැවෙයි. මෙය ශ ව. එක්වාදහස්

හත්සිය හැට අවේදී ලේඛනගත කරන ලද්දකි. ඒ මාතලේ හුළංග මුවේදී රත්වත්තේ විජයවර්ධන සෙනෙවිරත්න අභයකෝන් බණ්ඩාරනායක වාසල මුදියන්සේ මාතලේ දිසාව වශයෙන් සේවය කරන සමයෙහිය. මෙම ලේකම්මිටි සංග්‍රහ කිරීමේ මුඛ්‍යාධ්‍යාශය නම් කවර සමාජ ස්තරයකට හෝ අයත් පුද්ගලයකුට සිය රාජකාරිය පිළිබඳ දැනුවත් භාවයක් ලබාදීමය. ඒ අනුව මෙම ලේකම්මිටියෙහි භාෂාව භාවිත ආකාරය කිහිප ආකාරයකින් සාකච්ඡා කළ හැකිය.

ලේඛනය හා භාෂා ව්‍යවහාරය සම්බන්ධ විශේෂතා අධ්‍යයනයේදී ප්‍රමුඛව හඳුනාගත හැක්කේ වාර්තාවක ලක්ෂණයි. සම්පූර්ණයෙන් බැඳි අක්ෂරවලින් සංගෘහිතය. මෙහි වාක්‍ය වින්‍යාස විධි හෝ උක්ත, ආඛ්‍යාත සම්බන්ධය කෙරෙහි අවධානය යොමු කොට නැත. සම්පූර්ණ වාක්‍යයක් දැකිය හැක්කේ කිසියම් තොරතුරක් අවධාරණ කරන අවස්ථාවේදී පමණි. උදා: වශයෙන් වගපනහේ ගම්පත්තුවෙන් කද කෙරවල් වලවුවට මෙ මහපයිඬේ මුදලට තුට්ටු දහඅට මස්සකනක්කුවේ අය වෙනවාය ආදි වශයෙනි.

මෙහි ද්විරූපතා ලක්ෂණ මිශ්‍රව තිබේ. එනම් පොදු ජන ව්‍යවහාරයට ඉතාම සමීප වූ කථිත ව්‍යවහාරය බහුලය. උදා. ඔප්පු ගත් වගනම්, ඔප්පු ගත් වගයි, අය වෙන වග ශටිණම්, බින්න මැනිකාට රදා කුඹුර දෙපැලයි, එකමුනු තුං පැලයි ලේන්ඹුවාට ආදි වශයෙනි.

සිංහලයේ න, ණ, ල, ළ භාවිතය මහනුවර සමය වන විට ව්‍යවහාරයෙහි පැවැති ආකාරයේ පිළිබිඹුවක් මෙම ලේකම්මිටි විමර්ශනයෙන් හෙළිදරව් වෙයි. මෙහි ණම, බුද දිණ, කහරු ණයිදා, ශටිණම්, අළුත්සාලේ, ලමප්පු, බිලිඳි, පලමු, එලවුළු, රනවීරප්පු ආදි වශයෙන් න, ණ, ල, ළ භාවිතයේදී අවම සැලකිල්ලක් දක්වා තිබේ.

අනුස්වාරය පෙනුංවග, පයිඞ්ඬේ, පඬිත, උඬගා ආදි වශයෙන් විවිධාරයෙන් යෙදී තිබේ.

එකම රූපය විවිධ අවස්ථාවලදී විවිධාරයෙන් යොදා ඇත. බුලත්තුරුල්ල, බුලත්හුරුල්ල, බුලත්තුරුළු, බුලත්තුල්ල, ගන්නිලේ, ගණණිලේ, ගන්ණිලේ, අශ්වැන්න - අස්වැන්න, නාරන් - නාරණ් - නාරං, ලංසකාර - ලංශකාර ආදි වශයෙනි.

එක ම වචනය කිහිප විටක් එකම පත් ඉරුවෙහි යෙදෙන්නේ නම් වචනයෙහි මුල වර්ණය පමණක් යොදා තිබේ. මහලංසකාර දැකුම රිදී යන්න පසුව යෙදෙන්නෙ දැකුම රි වශයෙනි. බුලත්තුරුල්ල රිදී යන්න බු රි වශයෙන් යෙදීම ඊට නිදසුනි.

දීර්ඝ ඉ කාරය වෙනුවට ඉ අක්ෂරය ඉහළින් හල් කිරීම සංකේතවත් කරනුයේ "ඉ් " යනුවෙනි. දීර්ඝ ඉ කාරය ලේඛන ව්‍යවහාරයට මෙසමය වන විට පැමිණ නැති අතර එය සංවර්ධනීය අවස්ථාවක පැවැති ආකාරය පැහැදිලිය. උදාහරණ වශයෙන් ඉ්රියග ස්අගට, ඉ්රියගොල්ල ආදි වචන පෙන්වා දිය හැකිය.

භාෂා ශෛලිය විමර්ශනයේදී අවධානයට ලක් වූ කරුණක් නම් සමාරම්භය සනිටුහන් කරන ලද වාක්‍ය සඳහා සංස්කෘත පද බාහුල්‍යයෙන් යුතු දීර්ඝ වාක්‍ය ශෛලියක් භාවිත කිරීමයි.

උදා: **ස්වස්ති ශ්‍රී විරාජිත අමිතවර සිරි විභවානු ප්‍රවරතර විවිධ විසුද්ධ ප්‍රසිද්ධ විද්ග්ධජණ ප්‍රශස්ත නයනරසායන රුචිරිමැ තරුප ශ්‍රීධර සෞන්දර්යාභිරාම ප්‍රශස්තවරභඩාරවංශාභි ජාත වූ රත්වත්තේ විජයවර්ධන සෙනෙවිරත්න පඬිත අභයකෝන් බඩාරනායකවාහල මහා මුඳලි ණම ප්‍රසිද්ධ උතුමානන්වහන්ෂේ ගේ හස්ත ප්‍රාප්තව මාතලේ මහා දිසාව කරවන ප්‍රස්තාවට සකවර්ෂ එක්වා දහස් සත්සිය තිස්හයට පැමිණි මෙම වරුෂයෙහි නවාමාසේ දී මිට පළමු ලියා තුබුණු ලේකම්මිටිවල වගවාසගම් බලා වාසගම්ද ණිසා පෙලිං පෙල ඇද හැර සදා ලියවෙන ලද ලේකම්මිටියේ ලියවෙන දැකුම රාජකාරිය අය වෙන වග ශටිනම්** (114 පිටුව ජෞ පත්ඉරුව). මෙම උදාහරණයෙන් පැහැදිලි වනුයේ ආරම්භක වාක්‍යයෙහි ප්‍රථම භාගයෙහි ව්‍යක්ත සංස්කෘත පද බහුල ව්‍යවහාරයත් එහි අවසාන භාගයෙහි පොදුජන ව්‍යවහාරයට සමීප භාෂා ලක්ෂණත් ද දැකිය හැකි බවයි.

**සමෝධානය**

මාතලේ හමුදාවේ ලෙකම්මිටිය සමකාලීන රාජ්‍ය තොරතුරු වාර්තාවකි. එම නිසා එහි වාර්තාවක මුඛ්‍ය ලක්‍ෂණ දැකිය හැකිය. ප්‍රමුඛ වශයෙන්ම මෙහි ද්විරූපතා ලක්‍ෂණ විද්‍යමානය.

සාම්ප්‍රදායික ඡේක ප්‍රයෝගානුකූල භාෂා ව්‍යවහාරය මෙන්ම සමකාලීන ජනප්‍රයෝගානුකූල භාෂා ව්‍යවහාරයද මහනුවර සමයෙහි සාහිත්‍යයෙහි දැකිය හැකි අතර එකී සාහිත්‍යයෙහි පැණුනු යට කී සාහිත්‍ය ප්‍රවණතා ද්වයම මෙහි විද්‍යමානය. මෙම ව්‍යක්ත සහ අව්‍යක්ත භාෂා ශෛලිය දැකගැනීමට ලැබීම පරස්පරයකි. භාෂාව ශබ්දයෝගය, පදක යෝගය, වාක්‍ය වින්‍යාසය අක්‍රමවත්ය. භාෂාව ව්‍යාකරණානුකූල නොවීම නිසාම අර්ථය බොහෝ අවස්ථාවල ව්‍යාකූල ස්වරූපයක්ද ගනියි. මෙය නිරීක්‍ෂණය කළ හැක්කේ සමාරම්භක වාක්‍ය ලේඛනගත කිරීමේදීය. එහි සංස්කෘත පද බාහුල්‍යයෙන් යුක්ත දීර්ඝ වාක්‍ය ශෛලියක් දැක ගත හැකිය. මෙය සිංහලයෙහි දක්නට ලැබෙන අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධ ප්‍රවණතා ද්වයය වශයෙන් සෙනරත් පරණවිතානයන් විසින් හඳුනාගෙන තිබේ (පරණවිතාන, 1962: 40). මෙම ලේකම්මිටියෙහි දක්නට ලැබුණු තවත් සුවිශේෂ භාෂා ලක්ෂණයක් නම් මෙසමය වන විට "ඨ" අක්ෂරය රූපමය වශයෙන් භාවිතයට නො පැමිණීමයි. මේ හැරුණු විට තත්කාලීන ආර්ථික කටයුතු හා බැඳුණු භාෂා විශේෂතා, තදීය ඉඩම් බෙදී යාම, එම ඉඩම් රාජකාරිය හා භුක්ති ක්‍රමය අතර පැවැති මනා සම්බන්ධය හා බැඳුණු විශේෂ භාෂා ව්‍යවහාර රාශියක්ද මෙකී හමුදාවේ ලේකම් මිටියෙන් හෙළි වෙයි.

ප්‍රමුඛපද - හමුදාවේ ලේකම්මිටිය, රාජකාරිය, ද්විරූපතා ලක්‍ෂණ, අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධ ප්‍රවණතා ද්වයය

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අභයවර්ධන. එච්.ඒ.පී (1978) කඩඉම්පොත් විමර්ශනය, සංස්කෘතික කටයුතු දෙපර්තමේන්තුව, කොළඹ

--------------------- (2002), ලේකම්මිටි විමර්ශනය, ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුව, කොළඹ

කුමාර, ආනන්ද තිස්ස. (1992) සන්නස් සහ තුඩපත්, කොට්ටාව

---------------------, (1990) පැරණි ලක්දිව අත්තානි ප්‍රදාන විධි, කොළඹ

පරණවිතාන, සෙනරත්, (1962) සීගිරි ගී වියරණ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ

පීරිස්, රැල්ෆ් (2006) සිංහල සමාජ සංවිධාන, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

මාතලේ දිස්ත්‍රික්කයේ නමුදාවේ ලේකම් මිටිය, නො 09, පුස්කොළ පත්ඉරු 192 කි, ඉඩම් නිරවුල්කිරීමේ දෙපාර්තමේන්තුවේ ලේඛනාගාරය, ඉඩම් අමාත්‍යාංශය, පැලවත්ත පාර, බත්තරමුල්ල

විජේසිරි එම්. මැද උයන්ගොඩ. (1955), සිංහල ආඤ්ඤුව, කොළඹ

සන්නස්ගල, පුංචි බණ්ඩාර, (1961), සිංහල සාහිත්‍ය වංශය, ලේක්හවුස් කොළඹ

Coomaraswami. Ananda (1955), Mediaeval Sinhalese Arts, Pantheon, New York